**රජ්ගම ප්‍රාදේශීය සභාව**
**ගාල්ල දිස්ත්‍රික්කය**
**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**----------------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
--------------------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 03 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 11 දින ද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
------------------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රජ්ගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
-------------------------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉඩම් හා ගොඩනැගිලි අයිතම 31 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් රු.14,093,213 ක් වෙනුවෙන් ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | හික්කඩුව නගර සභාවට අයත් රු.5,760,007 ක් වූ ආදාහනාගාරය රජ්ගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශනවලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.2 නොසැසඳුනු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 02 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන / උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.1,437,034 ක වෙනසක් පැවතුණි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | කාලයක සිට පවතින අසමාන -තාවයන් බැවින් ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව විදුලි තොගය රු.148,599 ක් හා එදිනට භෞතික තොගය රු.197,546 ක් වීමෙන් රු.48,947 ක වෙනසක් පැවතුණි. | සැසඳීම් කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය අතර රු.3,401,225 ක වෙනසක් පැවතුණි. | වෙනස නිවැරදි කිරීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී තක්සේරුවකින් නිවැරදි කරමි. |

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2008 වර්ෂයේ සිට පැවත එන අවිනිශ්චිත ගිණුමේ රු.288,833 ක් වූ හර ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | අවිනිශ්චිත ගිණුම් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(අ)** | **ලැබිය යුතු ගිණුම්** | | |
| | වර්ෂ 08 සිට 18 දක්වා කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.10,670,683 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 07 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ලැබිය යුතු ශේෂයන් නිරවුල් කර ගත යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

| | | |
|---|---|---|
| වර්ෂ 13 සිට 18 දක්වා කාලයක සිට මූල්‍ය ප්‍රකාශනවල නොවෙනස්ව ඉදිරියට ගෙනෙමින් පවතින එකතුව රු.1,175,200 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 04 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**තොරතුරු ඉදිරිපත් නොකිරීම**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| එකතුව රු.11,677,789 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් සඳහා අවශ්‍ය තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | ලෙජර් ගිණුම් හා ලේඛන නිවැරදිව පිළියෙල කළ යුතුවේ. | ස්ථාවර වත්කම් ලේඛන ගත කිරීමට කටයුතු කරමි. |

**1.4 අනුකූල නොවීම්**

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ යනාදියට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) **1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති** | | | |
| (i) රීති 33 | වරිපනම් බදු ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයින් පිළිබඳ ලැයිස්තු සහ දේපල තහනම් කිරීමේ වරෙන්තු ලැයිස්තු පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී වරෙන්තු නිකුත් කර, හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | (ii) | රීති 59 | සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් පවත්වා කර්මාන්ත පිළිබඳ ලැයිස්තුවක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නිසි පරිදි කටයුතු කරමි. |
| | (iii) | රීති 193 | අයවැය සමඟ අය හා වැය විෂයයන් සසඳා අතිරික්තතා හා ඌණතාවලට හේතු දැක්වෙන ප්‍රකාශනයක් පිළියෙල කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| | (iv) | රීති 218 | සභාව සතු සියළුම ඉඩම් හා ගොඩනැගිලි වර්ෂයකට වරක් පරීක්ෂා කර නොතිබුණි. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුවේ | ඉදිරියේ දී නිසි පරිදි කටයුතු කරමි. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**<br>--------------------- | | | | |
| | (i) | මුදල් රෙගුලාසි 102 සිට 110 | ජල බවුසරය අනතුරට ලක්වීම පිළිබඳව කටයුතු කර, අදාළ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, අලාභ හානි පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| | (ii) | මුදල් රෙගුලාසි 570 හා 571 (1) (2) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක් ඉක්ම වූ වටිනාකම රු.666,846 ක් වූ තැන්පතු වර්ග 09 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| | (iii) | මුදල් රෙගුලාසි 1645 හා 1646 | වාහන 14 ක දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | ධාවන තත්ත්වයේ පැවති වාහන 14 ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාර කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී ඉන්ධන පරීක්ෂාවක් සිදු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.3,993,042 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,134,492 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තු ආදායම, බිල්කළ ආදායම,රැස්කළ ආදායම හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්,රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,037,500 | 1,191,291 | 1,298,674 | 6,422,719 | 1,831,000 | 1,161,836 | 884,608 | 6,526,942 |
| කුලී | 3,615,600 | 105,600 | 99,770 | 663,984 | 1,602,600 | 105,600 | 116,620 | 658,034 |
| බලපත්‍ර ගාස්තු | 1,770,500 | 703,762 | 703,762 | 81,622 | 910,500 | 632,354 | 632,354 | 81,622 |
| | 10,423,600 | 2,000,653 | 2,102,206 | 7,168,325 | 4,344,100 | 1,899,790 | 1,633,582 | 7,266,598 |

#### 2.2.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) වර්ෂ 14 ට වඩා වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන ලද රු.8,850,610 ක හිඟ වරිපනම් බදු ශේෂයක් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රධාන කාර්යාල බලප්‍රදේශයට අයත් වරිපනම් බදු හිඟය රු.3,252,113 ක් විය. මින් රු.2,593,849 ක හිඟයක් පැවති වරිපනම් ඒකක 1824 කින් කිසිදු මුදලක් අය නොවී තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2011 වර්ෂයෙන් පසුව වරිපනම් බදු නව තක්සේරුවක් කිරීමට කටයුතු කර නොතිබුණි. | කාලීනව තක්සේරු කිරීමට කටයුතු කළ යුතුවේ. | 2017 වර්ෂයේ සිට ඉල්ලීම් කර ඇතත් තක්සේරුවක් සිදු කර නොමැති බව දන්වමි. |

**2.2.3** උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පලාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.3,999,290 ක් හා මුද්දර ගාස්තු රු.113,193,266 ක් විය. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුවේ. | ඉදිරියේ දී හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිලියෙල කර නොතිබුණි. | වාර්ෂිකව ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුවේ. | ඉදිරියේ දී වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරමි. |

**(ආ) තිරසර සංවර්ධන ඉලක්ක**

| | | |
|---|---|---|
| තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ, තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බලප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍යය නැංවීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි. | තිරසර සංවර්ධන සඳහා වන දීර්සකාලීන සැලසුම් සකස් කර ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවිය යුතුවේ. | බල ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහල නැංවීමට ඉදිරියේ දී සැලැස්මක් සකස් කරන බව දන්වමි. |

**(ඇ)** **සණ අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

| | | |
|---|---|---|
| (i) කාබනික පොහොර ව්‍යාපෘතිය වර්ෂ 05 කට පෙර සිට නවතා දමා තිබූ බැවින් එම ව්‍යාපෘතිය සඳහා යොදාගත් කසළ කැබලි කිරීමේ යන්ත්‍රය, කසළ මිශ්‍ර කිරීමේ යන්ත්‍රය හා ගොඩනැගිල්ල භාවිතයෙන් බැහැර වී තිබුණි. සභාව විසින් දෛනිකව එකතු කරන දිරන කසළ ටොන් 02 ක් පමණ මොන්රෝවියාවත්ත කසළ අංගනයට භාරදීම සිදුකර තිබුණි. | මොන්රෝවියාව ත්ත කසළ ව්‍යාපෘතිය සක්‍රීය කර කසල කළමනාකරණය සඳහා දීර්ඝකාලීන වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. | ඉදිරියේදී වෙනත් රාජ්‍ය ආයතනයක් සමඟ කටයුතු කර ව්‍යාපෘතිය සක්‍රීය කිරීමට දිර්ඝ කාලීන වැඩපිළිවෙලක් සකස් කරමි. |

**(ඈ)** **ව්‍යාපෘති ඉටුනොකර අතහැර දැමීම.**

---------------------------------------------------

| | | |
|---|---|---|
| ඇස්තමේන්තු වටිනාකම රු.600,000 ක් වූ බෝපාගොඩ මහගෙදර වත්ත මාර්ගය ඉදිකිරීමට කටයුතු කර නොතිබුණි. | ව්‍යාපෘතිය කඩනමින් නිම කල යුතුවේ. | ඉදිරියේ දී නැවත ව්‍යාපෘතිය ආරම්භ කරන බව දන්වමි. |

**3.2** **කළමනාකරණ අකාර්යක්ෂමතා**

--------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | ------------------- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ දී වීථි පහන් නඩත්තුව සඳහා රු.3,229,491 ක් වැයකර තිබූ අතර, විදුලිබල මණ්ඩලය සමඟ ගිවිසුම්ගත නොවීම හේතුවෙන් වීථි පහන් නඩත්තු මුදල් ප්‍රතිපූර්ණය කරගත නොහැකි වී තිබුණි. | විදුලි බල මණ්ඩලය සමඟ ගිවිසුම් ගත විය යුතුවේ. | ඉදිරියේදී ගිවිසුම් ගත වීමට කටයුතු කරමි. |
| (ආ) | දැල්කඩ සතිපොල විධිමත්ව ආදායම් රැස්කිරීමේ කාර්යය සඳහා යොදවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සති පොල බදු අයකර සභාවේ ආදායම් ලෙස දැක්වීමට කටයුතු කල යුතුවේ. | ඉදිරියේදී සති පොල ආරම්භ කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | 2017 වර්ෂයේ දී කුරුඳු වගාවේ අස්වනු නෙලීමෙන් රු.456,500 ක ආදායමක් උපයාගෙන තිබූ අතර, 2018 හා 2019 වර්ෂවල කුරුඳු අස්වනු ආදායම ගිණුම් වලට ගෙන නොතිබුණි. | කුරුඳු වගාව නඩත්තු කර ආදායම් ගිණුම් වලට ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී නව ගිවිසුමක් මත බදු දී ආදායම් උපයා ගැනීමට කටයුතු කරමි. |

**3.3** **මානව සම්පත් කළමනාකරණය**

-------------------------------------------

| | | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | (i) | අනුමත තනතුරුවල පැවති පුරප්පාඩු 16 ක් සම්පූර්ණ කර ගැනීමට ක්‍රියාකර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරවා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |
| | (ii) | තනතුරු 07 ක පැවති අතිරික්ත සේවක සංඛ්‍යාව විධිමත් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තනතුරු විධිමත් කරගත යුතුවේ. | ප්‍රධාන අමාත්‍යාංශය හරහා ඉදිරියේදී තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| | (iii) | ආදේශක පදනම මත බඳවාගෙන තිබූ සේවකයන් 16 දෙනෙකු සඳහා වැටුප් හා දීමනා වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.4,668,100 ක මුදලක් ගෙවා තිබුණි. | තනතුරු විධිමත් කර ගත යුතුවේ. | ප්‍රධාන අමාත්‍යාංශය හරහා ඉදිරියේදී තනතුරු විධිමත් කර ගැනීමට කටයුතු කරමි. |
| | (iv) | සභාවේ සේවය කරනු ලබන ස්ථිර නිලධාරීන් හා සේවකයන් 102 ක් අතරින් 11 දෙනෙකු සඳහා පමණක් රාජකාරි ලැයිස්තු ලබා දී තිබුණි. | සියළුම සේවකයින්ට රාජකාරී පැවරුම් ලබා දිය යුතුවේ. | ඉදිරියේදී සියළු සේවකයන්ට රාජකාරී ලැයිස්තු ලබා දෙන බව දන්වමි. |
| **(ආ)** | | අයවිය යුතු රු.36,471 ක සේවක ණය ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ සේවක ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතුවේ. | මිය ගිය නිලධාරීන්ගේ ණය බොල් ණය ලෙස කපාහැරීමටත් අනෙකුත් ණය සම්බන්ධයෙන් සේවය කරන ස්ථානයට දැනුම් දී ඇත. |

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඩෙල්මාර් ජනපදය තුළ පිහිටි පෙර පාසල 2013 වර්ෂයෙන් පසු වසා දමා තිබූ අතර, පෙර පාසල අළුත්වැඩියා කර යළි ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. | පෙර පාසල අළුත්වැඩියා කර කඩිනමින් ආරම්භ කළ යුතුවේ. | 2020 වසරේ දී ආරම්භ කිරීමට කටයුතු කරමි. |
| (ආ) | රු.19,174,074 ක් වැයකර ඉදිකිරීම් අවසන් කර තිබූ ආදාහනාගාරය සමාලෝචිත වර්ෂයේ මාර්තු 16 දින විවෘත කිරීමෙන් පසු මහජන විරෝධතා හේතුවෙන් 2019 මැයි 09 දිනෙන් පසු වසා දමා තිබුණි. හඳුනාගත් අඩුපාඩු සම්පූර්ණ කර නැවත සේවය ලබාදීම ආරම්භ කර නොතිබුණි. | ආදාහනාගාරයේ අඩුපාඩු නිවැරදි කර, පරිසර බලපත්‍රයක් ලබාගෙන කඩිනමින් ආරම්භ කල යුතුවේ. | අඩුපාඩු නිවැරදි කිරීමට පළාත් පාලන අමාත්‍යාංශය වෙත අනුමැතියට යවා ඇති අතර, අනුමැතිය ලැබූ පසු කඩිනමින් ආදාහනාගාරය ආරම්භ කරන බව දන්වමි. |

## 3.5 වත්කම් කළමනාකරණය

### 3.5.1 නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වටිනාකම රු.17,975,750 ක් වූ ජේ.සී.බී. යන්ත්‍රය, රු.137,500 ක් වූ මහේන්ද්‍රා කැබ් රථය, රු.3,500,000 ක් වූ ගලි බවුසරය ධාවනයෙන් ඉවත් කර තිබුණි. | අළුත්වැඩියා කර ධාවනයට යොදාගත යුතුවේ. | බැකෝ යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා යොමුකර ඇති අතර අනෙකුත් වාහන ඉදිරියේදී අළුත්වැඩියාව සඳහා යොමු කරමි. |

**3.5.2 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ට්‍රැක්ටරයක්, කැබ් රථයක්, ට්‍රේලර් 02 ක් හා සිමෙන්ති මිශ්‍රණ යන්ත්‍රයක් 2001 වර්ෂයේ සිට නිෂ්ක්‍රීයව පැවතුණි. | අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කිරීම කළ යුතුවේ. | චක්‍රලේඛ ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කරමි. |

**4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ප්‍රමාණාත්මක අභ්‍යන්තර විගණනයක් සිදුකර එහි වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | 2020 වර්ෂයේ ජුනි මස සිට නිලධාරියෙක් පත් කරන බව දන්වමි. |

**4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවීම සිදු කළ ද, සමාලෝචිත වර්ෂය තුළ කමිටුව එක් වරක් පමණක් රැස් වී තිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුවේ. | 2020 වර්ෂයේදී නිවැරදිව කමිටු පවත්වන බව දන්වමි. |